12767

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II පත්‍රය

නම/විභාග අංකය :- .................................................................. කාලය : පැය 03 යි.

- ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.

---

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"කෝපල" කතරගම ප්‍රදේශයේ ජීවත් වන උත්සාහවන්ත තරුණයෙකි. ඔහු තමා ඉතිරි කරගත් මුදලින් කුඩා ලොරි රථයක් මිලට ගෙන පලතුරු ගොවිපළවලින් පලතුරු මිලට ගෙන දකුණු පළාතේ ඇති පලතුරු අලෙවි කිරීමේ වෙළෙඳසැල්වලට විකිණීමේ ව්‍යාපාරයක් ඇරඹීය. ඒ සඳහා දක්ෂ සේවකයකු ද බඳවා ගන්නා ලදී.

(1) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාරය විසින් සපයනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(1) ආහාර (2) ඇඳුම් (3) නිවාස (4) ආරක්ෂාව

(2) ඉහත ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
(1) ඒක පුද්ගල ව්‍යාපාරයි. (2) හවුල් ව්‍යාපාරයි.
(3) සංස්ථාපිත සමාගම් (4) සමිති සංවිධානයි.

(3) කෝපල මිල දී ගත් කුඩා ලොරි රථය අයත් වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

(4) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ගයට 'ශක්තියක්' වන්නේ,
(1) පලතුරු මිල ඉහළ යාමය. (2) පලතුරු තරඟකරුවන් අඩු ය.
(3) පලතුරු ඉල්ලුම ඉහළ යාමයි. (4) දක්ෂ සේවකයකු සිටීමයි.

(5) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාර සංවිධානය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත. (2) මෙය සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
(3) මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (4) කෝපලගේ වගකීම සීමාසහිතය.

(6) නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතා කර භාණ්ඩ නිෂ්පාදනය කිරීම.............................. පරිසර සාධකයක් වන අතර බැංකු පොලී අනුපාතිකය ඉහළ දැමීම .............................. පරිසර සාධකවලට අයත් වේ.
(1) තාක්ෂණික, ආර්ථික (2) ආර්ථික, දේශපාලන
(3) ගෝලීය, භෞතික (4) තාක්ෂණික, දේශපාලන

(7) ව්‍යාපාර ඇල්මැති පාර්ශව කිහිපයක් ව්‍යාපාරය තුළින් ඉටු කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු කීපයක් පහත දැක්වේ.
A ආයෝජනයේ සුරක්ෂිතතාව
B සාධාරණ වැටුපක් ලබා ගැනීම.
C ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම.
D රැකියා සුරක්ෂිතතාව
ඉහත අරමුණු අතුරින් සේවකයින් විසින් ඉටුකරගැනීමට බලාපොරොත්තු වන අරමුණු වන්නේ,
(1) A, B (2) B, C (3) C, D (4) B, D

(8) මෑතකදී ශ්‍රී ලංකා රජය විසින් සහල් සඳහා පාලන මිලක් නියම කරන ලදී.
මෙය අයත් වන පරිසර සාධකය කුමක් ද?

(1) ආර්ථික පරිසරය (2) නෛතික පරිසරය (3) තාක්ෂණික පරිසරය (4) ගෝලීය පරිසරය

(9) ව්‍යාපාර සංවිධානවලට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A අසීමිත වගකීම
B අඛණ්ඩ පැවැත්ම
C පුද්ගලයාගේ නමින් බැඳී පැවීම.
D නෛතික පුද්ගල භාවයක් තිබීම.
E පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.

මෙම ලක්ෂණ අතුරින් ඒක පුද්ගල ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, C (2) A, C, D (3) A, C, E (4) C, D, E

(10) "මහිෂා සඳමාලි" විසින් "මහිෂා සැලෝන්" නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙම ව්‍යාපාරයේ වගකීම සීමිත වේ.
(2) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාරයට නෛතික පුද්ගල භාවයක් ඇත.
(4) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.

(11) ඒක පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවලට අදාළව සමාන ලක්ෂණ කාණ්ඩය කුමක් ද?

(1) වගකීම සීමිත වීම, අඛණ්ඩ පැවැත්ම, නෛතික පුද්ගල භාවයක් තිබීම.
(2) අසීමිත වගකීම, අඛණ්ඩ පැවැත්ම, ස්වාධීන තීරණ ගත හැකි වීම.
(3) ලියාපදිංචිය අනිවාර්ය නොවීම, අඛණ්ඩ පැවැත්ම, නෛතික පුද්ගලභාවයක් තිබීම.
(4) අසීමිත වගකීම, අඛණ්ඩ පැවැත්මක් නැති වීම, නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

(12) හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව ඒක පුද්ගල ව්‍යාපාරයක වාසියක් වන්නේ,

(1) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
(2) වගකීම බෙදී යාම.
(3) උපයන සියලු ලාභ අයිතිකරු සතුවීම.
(4) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.

(13) ඒක පුද්ගල හා හවුල් ව්‍යාපාරවලට සාපේක්ෂව සංස්ථාපිත සමාගම්වල වාසි කිහිපයක් වන්නේ.

(1) සීමිත වගකීම, නෛතික පුද්ගලභාවයක් තිබීම, වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම.
(2) අසීමිත වගකීම, අඛණ්ඩ පැවැත්ම, නෛතික පුද්ගලභාවයක් තිබීම.
(3) සීමිත වගකීම, පහසුවෙන් ආරම්භ කළ හැකි වීම, අඛණ්ඩ පැවැත්ම
(4) අසීමිත වගකීම, අඛණ්ඩ පැවැත්ම, අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කිරීම.

(14) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ සෘජු පාලනයට අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(1) රාජ්‍ය සමාගම
(2) රාජ්‍ය දෙපාර්තමේන්තුව
(3) රාජ්‍ය සංස්ථා
(4) සංස්ථාපිත සමාගම්

(15) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ලක්ෂණ පවතින ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) හවුල් ව්‍යාපාරයි.
(2) රාජ්‍ය සමාගම් ය.
(3) සමුපකාර ව්‍යාපාරය.
(4) රාජ්‍ය දෙපාර්තමේන්තුය.

(16) තනි ව්‍යාපාර / හවුල් ව්‍යාපාරවල ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ විට ඊට අදාළ සහතිකය නිකුත් කිරීමේ බලධාරියා වන්නේ,

(1) ග්‍රාම නිලධාරීවරයා ය.
(2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ය.
(3) සමුපකාර කොමසාරිස්වරයා ය.
(4) ප්‍රාදේශීය ලේකම්වරයා ය.

(17) පහත 'X' තීරුවෙන් විවිධ ගනුදෙනුවලින් ජනිත වන ගිණුම් වර්ග කිහිපයක් ද, 'Y' තීරුවෙන් ඒ සඳහා බලපාන නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| 'X' තීරුව | 'Y' තීරුව |
|---|---|
| 1. වත්කම් | A බැංකු ණය මුදල |
| 2. ආදායම් | B යන්ත්‍රෝපකරණ |
| 3. වගකීම් | C රක්ෂණ ගාස්තු |
| 4. වියදම් | D විකුණුම් |

'X' තීරුව හා 'Y' තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) B, D, A, C (2) B, A, D, C (3) B, A, C, D (4) A, B, C, D

(18) ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

වත්කම් (රු) = අයිතිකරුගේ හිමිකම් (රු) + වගකීම් (රු)

+ 60,000 = -------------- + 60,000

ඉහත ගිණුම්කරණ සමීකරණයේ සටහන් කර ඇති ගනුදෙනුව වන්නේ,

(1) අයිතිකරු රු. 60,000/-ක් ව්‍යාපාරයට යෙදවීම.
(2) ණය හිමියෙකු වූ දිනේෂ්ට රු. 60,000/-ක් මුදලින් ගෙවීම.
(3) ඉඳුනිල්ගෙන් රු. 60,000/-ක බඩු තොගයක් ණයට ගැනීම.
(4) රු. 60,000/-ක බඩු තොගයක් ණයට විකිණීම.

(19) පහත සඳහන් ගනුදෙනු අතුරෙන් අයිතිකරුගේ හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව කුමක් ද?

(1) අයිතිකරු රු. 50,000/-ක මුදලක් ව්‍යාපාරයෙන් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
(2) රක්ෂණ ගාස්තු රු. 6,000/-ක් මුදලින් ගෙවීම.
(3) රු. 20,000/-ක් ණය හිමියකුට ගෙවීම.
(4) රු. 12,000/-ක මුදලක් විකුණුම්වලින් ලැබීම.

(20) 2017.01.01 දිනට නිමාලිගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය පහත ආකාරයට නිරූපණය විය.

| වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
|---|---|---|---|---|
| 165000 | = | 100,000 | + | 65,000 |

රු. 35,000/-ක් වටිනා ලී බඩු ණයට ගැනීමෙන් පසු මෙම ව්‍යාපාරයේ නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | 130,000 | = | 100,000 | + | 30,000 |
| (2) | 200,000 | = | 100,000 | + | 100,000 |
| (3) | 165,000 | = | 65,000 | + | 100,000 |
| (4) | 200,000 | = | 135,000 | + | 65,000 |

(21) ව්‍යාපාරයක මූලික පොත්වල සටහන් කර තිබූ ගනුදෙනු පහත දැක්වේ.

(1) ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු රු. 4,000/-ක් මුදලින් ගෙවීම.
(2) නැවත විකිණීම සඳහා රු. 20,000/-ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.

මෙම ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේදී භාවිතා කළ මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගෙවීම් වවුචරය හා විකුණුම් ඉන්වොයිසිය
(2) ලදුපත හා ගැනුම් ඉන්වොයිසිය
(3) ජ.නල් වවුචරය හා ලදුපත
(4) ගෙවීම් වවුචර හා ගැනුම් ඉන්වොයිසිය

(22) ව්‍යාපාරයක විකුණුම් ජ'නලයක ඇතුළත් කරනුයේ,

(1) සියලු ම ණයට විකුණුම් ය.
(2) අත්පිට මුදලට විකුණුම් ය.
(3) ජංගම නොවන වත්කම් ණයට විකුණුම්ය.
(4) වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් ය.

(23) මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීම සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලේඛන මොනවා ද?

(1) ලදුපත හා ගෙවීම් වවුචරය
(2) ගැනුම් ඉන්වොයිසිය හා ගෙවීම් වවුචරය
(3) ලදුපත හා විකුණුම් ඉන්වොයිසිය
(4) ජ'නල් වවුචරය හා සුළු මුදල් ගෙවීම් වවුචරය

(24) ගිණුම්කරණ සමීකරණයේ වත්කම් පැත්තට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,

(1) අත්පිට විකුණුම් මත මුදල් ලැබීම.
(2) බැංකු ණය මුදලක් ලබා ගැනීම.
(3) ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම.
(4) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ලබා ගැනීම.

(25) කිසියම් ගනුදෙනුවක් සටහන් කිරීම සඳහා එයට අදාළ විශේෂිත මූලික පොතක් නොමැති අවස්ථාවක දී එම ගනුදෙනුව සටහන් කිරීමට යොදා ගනු ලබන මූලික සටහන් පොත කුමක් ද?

(1) මුදල් පොත (2) පොදු ජර්නලය (3) විකුණුම් ජර්නලය (4) සුළු මුදල් පොත

(26) මුදල් පොතේ බැර පැත්තේ සටහන් කෙරෙනුයේ,

(1) ලද වට්ටම් ය. (2) වෙළඳ වට්ටම් ය. (3) දුන් වට්ටම් ය. (4) මුදල් වට්ටම් ය.

(27) පහත සඳහන් දෑ අතුරින් ජංගම නොවන වත්කම් වන්නේ,

(1) ගොඩනැගිලි, ලී බඩු, භාණ්ඩ තොගය
(2) ලී බඩු, යන්ත්‍ර, මුදල්
(3) ගොඩනැගිලි, ලී බඩු, ණය ගැතියෝ
(4) ගොඩනැගිලි, ලී බඩු, යන්ත්‍ර

(28) අයිතිකරු රු. 100,000/-ක අතිරේක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යෙදීමට අදාළ ද්විත්ව සටහන කුමක් ද?

(1) ප්‍රාග්ධන ගිණුම හර මුදල් ගිණුම බැර
(2) මුදල් ගිණුම හර ගැතිලි ගිණුම බැර
(3) මුදල් ගිණුම හර ප්‍රාග්ධන ගිණුම බැර
(4) ගැතිලි ගිණුම හර මුදල් ගිණුම බැර

(29) වත්කම් සහ වගකීම් වැඩිවීමට බලපාන ගනුදෙනුවක් වන්නේ,
(1) යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම.
(2) බැංකු ණයක් ලබා ගැනීම.
(3) බැංකු ණය ගෙවීම.
(4) අයිතිකරු ව්‍යාපාරයට මුදල් යෙදවීම.

(30) වැඩිවීම හර අඩු වීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය ඇතුළත් ගිණුම් වර්ග වන්නේ,
(1) හිමිකම් ගිණුම් සහ වගකීම් ගිණුම්
(2) වත්කම් ගිණුම් හා ආදායම් ගිණුම්
(3) වත්කම් ගිණුම් සහ වියදම් ගිණුම්
(4) වගකීම් ගිණුම් සහ ආදායම් ගිණුම්

(31) ගිණුම් පොත්වල සටහන් කළ හැකි ව්‍යාපාරික ගනුදෙනුවක් වන්නේ,
(1) ව්‍යාපාරයේ කීර්ති නාමය ගණනය කිරීම.
(2) රු. 20,000/-කට භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
(3) රු. 22,000/- වේතනයකට යටත් ගිණුම් ලිපිකරුවකු තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.
(4) ව්‍යාපාරයේ භාණ්ඩ බෙදාහැරීමට වෑන් රථයක් තෝරා ගැනීම.

(32) රු. 50,000/- ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට විකිණීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.
(1) මුදල් ගිණුම හර, විකුණුම් ගිණුම බැර
(2) ණය ගැති ගිණුම හර, ගැණුම් ගිණුම බැර
(3) ණය ගැති ගිණුම හර විකුණුම් ගිණුම බැර
(4) මුදල් ගිණුම හර ණයගැති ගිණුම බැර

(33) ව්‍යාපාරයක ජංගම නොවන වගකීමක් වන්නේ,
(1) වෙළඳ ණය හිමියෝ
(2) ගෙවිය යුතු විදුලිබිල
(3) බැංකු අයිරාව
(4) බැංකු ණය

(34) ව්‍යාපාරයක ඇති මුදලින් මැනිය හැකි මුළු වත්කම්වල එකතුව සමාන වන්නේ,
(1) ප්‍රාග්ධනය හා වගකීම්වල එකතුවට වේ.
(2) වගකීම්වලට වේ.
(3) ප්‍රාග්ධනයට වේ.
(4) ජංගම නොවන වගකීම්වලට වේ.

(35) අයිතිකරු රු. 200,000/- ක මුදලක් ව්‍යාපාරයෙන් ආපසු ගැනීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,
(1) ගැනිලි ගිණුම හර, මුදල් ගිණුම බැර
(2) ගැනිලි ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර
(3) ප්‍රාග්ධන ගිණුම හර, බැංකු ගිණුම බැර
(4) මුදල් ගිණුම හර, බැංකු ගිණුම බැර

(36) මුදල් පොතේ හර පැත්තේ සටහන් කරන ගනුදෙනු කිහිපයකට නිදසුන් වන්නේ,
(1) අත්පිට විකුණුම්, මුදල් ණයට ගැනීම, සේවක වැටුප්
(2) ණයට විකුණුම්, මුදල් ණයට ගැනීම, ප්‍රාග්ධනය මුදලින් යෙදවීම.
(3) අත්පිට විකුණුම්, මුදල් ණයට ගැනීම, ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම.
(4) අත්පිට විකුණුම්, ණයගැතියන්ගෙන් මුදල් ලැබීම, ණයහිමියන්ට ගෙවීම.

(37) ව්‍යාපාරවල මුදල් ගෙවීම් සනාථ කිරීම සඳහා ඊට අදාළ තොරතුරු ඇතුළත් කර පිළියෙල කරන ලිපිවිල්ල කුමක් ද?
(1) ලදුපත
(2) විකුණුම් ඉන්වොයිසිය
(3) හරපත
(4) ගෙවීම් වවුචරය

(38) දුන් වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන තෝරන්න.
(1) දුන් වට්ටම් හර
ණයගැති ගිණුම බැර
(2) ණයගැති ගිණුම හර
දුන් වට්ටම් ගිණුම බැර
(3) දුන් වට්ටම් ගිණුම හර
මුදල් ගිණුම බැර
(4) මුදල් ගිණුම හර
දුන් වට්ටම් බැර

(39) ව්‍යාපාරයක නිතර නිතර සිදුවන අඩු වටිනාකම් සහිත මුදල් ගෙවීම් සටහන් කරනු ලබන මූලික පොත කුමක් ද?
(1) පොදු ජර්නලය
(2) සුළු මුදල් පොත
(3) මුදල් පොත
(4) බැංකු ගිණුම

(40) සුළු මුදල් අග්‍රිමය ලැබෙන විට හා ප්‍රතිපූර්ණය කෙරෙන විට අදාළ ද්විත්ව සටහන කුමක් ද?
(1) සුළු මුදල් පොත හර
මුදල් පොත බැර
(2) මුදල් පොත හර
සුළු මුදල් පොත බැර
(3) අදාළ වියදම් ගිණුම හර
සුළු මුදල් පොත බැර
(4) සුළු මුදල් පොත හර
අදාළ වියදම් ගිණුම බැර

(මුළු ලකුණු 40යි.)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

### 10 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II පත්‍රය

නම/විභාග අංකය :- ........................................................

❖ **පළමු වන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න 02ක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වටිනා වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත කටයුත්තක් ව්‍යාපාර ලෙස අර්ථ දැක්විය හැකි ය.

(i) ව්‍යාපාර විසින් ඉටු කරනු ලබන මිනිස් අවශ්‍යතා 4ක් නම් කරන්න.

(ii) ව්‍යාපාරයක පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු 2ක් දක්වන්න.

(iii) ව්‍යාපාරයකින් ප්‍රතිලාභ අපේක්ෂිත පාර්ශ්ව 4ක් නම් කරන්න.

(iv) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා නිෂ්පාදන ව්‍යාපාරවලට නිදසුන් 02 බැගින් දක්වන්න.

(v) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා උපයෝගී ගනු ලබන නිෂ්පාදන සාධක නම් කරන්න.

• 'පද්මාලිගේ' ව්‍යාපාරයේ 2017.01.01 දිනට පහත සඳහන් ශේෂ දක්නට ලැබුණි.

| | |
|---|---|
| බැංකු ණය | රු. 600,000 |
| ලීබඩු උපකරණ | රු. 400,000 |
| ණය හිමියෝ | රු. 200,000 |
| ණය ගැතියෝ | රු. 100,000 |
| භාණ්ඩ තොගය | රු. 400,000 |
| මුදල් | රු. 300,000 |

ජනවාරි මාසයේ පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදු විය.

(1) වැටුප් සඳහා රු. 30,000ක් මුදලින් ගෙවීම.

(2) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල් රු. 10,000යි.

(3) ණය හිමියන්ට රු. 20,000ක් ගෙවීම.

(vi) 2017.01.01 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න.

(vii) 2017.01.01 දිනට මුළු ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම්වල අගය වෙන වෙනම ගණනය කර දක්වන්න.

(viii) වැටුප් සඳහා රු. 30,000/-ක් මුදලින් ගෙවීම ගිණුම් ගත කරන ආකාරය දක්වන්න.

(ix) පද්මාලිගේ හිමිකම අඩුවීමට බලපෑ හේතු 2ක් දක්වන්න.

(x) ණය හිමියන්ට රු. 20,000ක් ගෙවීම යන ගනුදෙනුවේ ද්විත්ව බලපෑම දක්වන්න.

(මුළු ලකුණු 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

❖ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(2) (i) ඉල්ලුම හා වුවමනා අතර ඇති වෙනස්කම් 2ක් දක්වන්න.

(ii) ඔබගේ පාසල සඳහා ඇල්ම දක්වන පාර්ශව 4ක් දක්වන්න.

(iii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය කෙරෙහි බලපාන සාධක 2ක් දක්වා ඔවුන් ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වන ආකාරය දක්වන්න.

(iv) තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම්වලට නිදසුන් 02ක් දක්වන්න.

(මුළු ලකුණු 8)

(3) (i) පෞද්ගලික අංශයට හා රාජ්‍ය / පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන දෙක බැගින් දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකි ය.

(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයකට ගිවිසුම්වලට එළඹීම, නඩු පැවරීම ආදිය ව්‍යාපාර නාමයෙන් සිදු කළ හැකි ය.

(ඇ) හවුල් ව්‍යාපාරයේ සිටිය යුතු උපරිම සාමාජිකයින් සංඛ්‍යාව 1890 හවුල් ව්‍යාපාර පනත අනුව තීරණය කර ඇත.

(ඈ) රජය විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් රාජ්‍ය සංස්ථා පාලනය වේ.

(iii) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සංස්ථාපිත සමාගම්වල ප්‍රධාන ලක්ෂණ 04ක් දක්වන්න.

(iv) පාසල් සිසුන්ට සෘජුව ම නොමිලේ සේවා සපයන රාජ්‍ය දෙපාර්තමේන්තු 02ක් නම් කරන්න.

(මුළු ලකුණු 8)

(4) (i) සමාජ සුබ සාධනය අරමුණු කරගත් ඔබ ප්‍රදේශයේ පවත්නා සංවිධාන 02ක් දක්වන්න.

(ii) 'ඒක පුද්ගල ව්‍යාපාරයක් බොහෝ විට අයිතිකරු විසින් ම කළමනාකරණ කටයුතු සිදු කරයි. පැහැදිලි කරන්න.

(iii) සෑම ම ඒක පුද්ගල ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ය.

මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? නොවන්නේ ද? හේතු දක්වන්න.

(iv) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම තුළින් ඒක පුද්ගල ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රයෝජන 02ක් දක්වන්න.

(මුළු ලකුණු 8)

## II කොටස - ගිණුම්කරණය

❖ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(5) (i) ගිණුම්කරණය යනු කුමක් ද? (ලකුණු 2)

(ii) ව්‍යාපාර සංවිධානයකට ගිණුම්කරණය අවශ්‍ය වීමට හේතු 02ක් දක්වන්න. (ලකුණු 2)

(iii) පහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරන්න.

A. අයිතිකරු රු. 300000/-ක මැයට ණය මුදලක් ලබාගැනීම.

B. නිමාලි සමාගමෙන් රු 75,000/-ක භාණ්ඩ ණයට ගැනීම.

C. රක්ෂණ ගාස්තු සඳහා රු. 15,000/-ක් ගෙවීම.

D. නිමාලි සමාගමට රු. 25,000/-ක මුදලක් ගෙවීම

E. රු. 90,000/-ක් වටිනා භාණ්ඩ මිලට ගැනීම.

F. අයිතිකරු රු. 200000/-ක අමතර ප්‍රාග්ධනය යෙදීම.

G. රු. 25,000/-ක් වූ භාණ්ඩ තොගයක් රු. 30,000/-කට විකිණීම

H. විකුණුම් කොමිස් ආදායම ලෙස රු. 2000/-ක් ලැබීම. (ලකුණු 8)

(මුළු ලකුණු 12)

(6) (i) පහත දැක්වෙන ගනුදෙනු වෙනුවෙන් පිළියෙල කරන මූලික සටහන් පොත දක්වන්න.

A. වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම.

B. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සම්බන්ධ ගනුදෙනු

C. වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම.

D. බැංකු ජංගම ගිණුම මගින් සිදු කෙරෙන ගනුදෙනු (ලකුණු 2)

(ii) ඉහත දැක් වූ එක් එක් මූලික සටහන් පොතට අදාළ වන මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දක්වන්න. (ලකුණු 2)

(iii) මූලාශ්‍ර ලේඛනවල සාමාන්‍යයෙන් අන්තර්ගත වන කරුණු 4ක් නම් කරන්න. (ලකුණු 4)

(iv) මූලාශ්‍ර ලේඛනවල ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 12)

(7) (i) ව්‍යාපාරයක මුදල් ලැබීම්වලට හා ගෙවීම්වලට නිදසුන් 2 බැගින් සපයන්න. (ලකුණු 2)

(ii) මුදල් පොත තුළින් ඉටුවන ද්විත්ව කාර්යයන් දක්වන්න. (ලකුණු 2)

(iii) පහත දැක්වෙන්නේ 2017.01.01 දින කපිල විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු ය.

| දිනය | ලදුපත් අංකය | චෙවුචර් අංකය | විස්තරය |
|---|---|---|---|
| 2017.01.01 | 01 | - | රු. 160,000ක් ප්‍රාග්ධනය යෙදවීම. |
| 2017.01.03 | - | 0001 | රු. 90,000ක වෙළෙඳ භාණ්ඩ මිල දී ගැනීම. |
| 2017.01.05 | 02 | - | රු. 100,000ක බැංකු ණය ලබා ගැනීම. |
| 2017.01.12 | - | 002 | රු. 25,000ක ලී බඩු මිලට ගැනීම. |
| 2017.01.20 | 03 | - | අත්පිට විකුණුම්වලින් රු. 80,000ක් ලැබීම. |
| 2017.01.22 | 04 | - | රු. 6,000ක පොලී ආදායමක් ලැබීම. |
| 2017.01.29 | - | 03 | රු. 8,000ක් රක්ෂණ ගාස්තු ලෙස ගෙවීම. |

ඉහත ගනුදෙනු කපිලගේ මුදල් පොතේ සහ අනෙකුත් ලෙජර් ගිණුම්වල සටහන් කරන්න. (ලකුණු 8)

(මුළු ලකුණු 12)